සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

32 | S | I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 12 - 2019

විභාග අංකය .... **ව්‍යාපාර අධ්‍යයනය I** කාලය පැය දෙකයි

උපදෙස්

- සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

01. පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ වීම, ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළහැකිවීම යනාදිය ලක්ෂණ වශයෙන් සැලකිය හැක්කේ,
1. ව්‍යාපාරයක 2. අවශ්‍යතාවයක 3. අරමුණක 4. පරමාර්ථයක 5. වුවමනාවක (.....)

02. ව්‍යාපාරයක පරමාර්ථයක් නොවන්නේ,
1. සේවක සුභසාධනය 2. ලාභ උපරිම කිරීම.
3. කොටස්වල වෙළඳපල අගය පහළ දැමීම. 4. ව්‍යාපාරිකයාගේ පුද්ගලික තෘප්තිය ඉහළ දැමීම.
5. වෙළඳපොල කොටස වැඩිකර ගැනීම. (.....)

03. ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථාවක් නොවන්නේ,
1. කෘෂිකාර්මික ආර්ථිකය. 2. භාණ්ඩ හුවමාරුව 3. මුදල් භාවිතය
4. කාර්මික විප්ලවය 5. තොරතුරු ආර්ථිකය (.....)

04. ප්‍රාථමික අංශය යටතට ගැනෙන පතල් හා කැණීම් පහත සඳහන් අංශ අතුරෙන් අයත් වනුයේ,
1. කෘෂිකාර්මික අංශයට 2. තෘතීය අංශයට 3. සේවා අංශයට
4. කාර්මික අංශයට 5. ද්විතියික අංශයට (.....)

05. ''සමාජය තුළ ධනාත්මක බලපෑමක් ජනිත කිරීමට ව්‍යාපාර ක්‍රියාවලිය කළමණාකරණය කරන්නේ කෙසේද? යන්න පිළිබඳව වූ අදහසකි සමාජ වගකීම්''
ඉහත නිර්වචනය සිදුකරන ලද්දේ,
1. USA විසිනි. 2. මාලන් බේකර් විසිනි. 3. පිලිපීනය විසිනි.
4. නාරායන් මූර්ති විසිනි. 5. හෙන්ඩ්‍රි වින්ට්ස්බර්ග් විසිනි. (.....)

06. රජයේ ආර්ථික අරමුණක් නොවන්නේ,
1. ආර්ථික ස්ථායිතාව. 2. සාධාරණ මිල 3. ආර්ථික වර්ධනය හා සංවර්ධනය.
4. පූර්ණ සේවා නියුක්තිය 5. සාධාරණ ආදායම් ව්‍යාප්තිය. (.....)

07. රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර දායකවන ආකාරයක් නොවන්නේ,
1. බදු ගෙවීම. 2. දේශීය සම්පත් භාවිතය 3. සේවා නියුක්තියට දායකවීම.
4. පරිසරහානිය අවම කිරීම. 5. ලාභ උපරිම කිරීම. (.....)

08. රජයේ පුනරාවර්ථන වියදමක් නොවන්නේ,

1. මහා මාර්ග ඉදිකිරීම සඳහා වියදම් දැරීම.
2. සේවක වැටුප් ගෙවීම්.
3. පොලී ගෙවීම්.
4. එදිනෙදා කටයුතු සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම්.
5. දුරකථන ගාස්තු ගෙවීම්. (.....)

09. තනි හා හවුල් ව්‍යාපාර යන ව්‍යාපාර සංවිධාන දෙකට අයත් නොවන ප්‍රකාශය වන්නේ,

1. වගකීම සීමිත වීම, පැවැත්ම අඛණ්ඩ වීම, නෛතික පුද්ගල බව, අයිතිය පෞද්ගලික වීම.
2. වගකීම සීමිත වීම, නෛතික පුද්ගල බව තිබීම, අයිතිය පුද්ගලික, අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම.
3. වගකීම අසීමිත වීම, නෛතික පුද්ගලබව නොමැතිවීම, අයිතිය පුද්ගලිකවූ පවැත්ම අඛණ්ඩ නොවීම.
4. වගකීම අසීමිත, නෛතික පුද්ගල බවතිබීම, පුද්ගලික අයිතිය, පැවැත්ම අඛණ්ඩ වීම.
5. වගකීම අසීමිත නෛතිකපුද්ගල බව නොමැති, පැවැත්ම අඛණ්ඩ අයිතිය පුද්ගලික වූ. (.....)

10. 1890 හවුල් ආඥාපනතින් අංක 24 වගන්තියට ඇතුළත් නොවන ප්‍රකාශය තෝරන්න.

1. ප්‍රාග්ධනයට සමානව දායක විය යුතුයි.
2. ලාභ සමානව බෙදාගත යුතුයි.
3. හවුල් කරුවන්ගේ ගැනිලි සඳහා 5% පොළියක් අයකළ යුතුයි.
4. ණය අත්තිකාරම් සඳහා 5% ක වාර්ෂික පොලියක් හිමි විය යුතුයි.
5. හවුල් ව්‍යාපාරයේ කටයුතු සඳහා සියළු හවුල්කරුවන් දායක විය යුතුයි. (.....)

11. සංස්ථාපිත පොදු සමාගම් සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

1. කොටස් අයිතිය නිදහසේ පැවරිය හැකිවීම.
2. කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත්කළ හැකිවීම.
3. ලැයිස්තුගත සමාගමක් වීම හැකියාවක් නොමැතිවීම.
4. වගකීම අසීමිත හා පැවැත්ම අඛණ්ඩ වීම.
5. ලියාපදිංචිය අනිවාර්ය හා නෛතික පුද්ගල බව පැවතීම. (.....)

12. පහත සඳහන් සංස්ථාපිත සමාගම් අතරින් ඇපයෙන් සීමිත සමාගමක් වන්නේ,

1. සීමා සහිත මධ්‍යම තැන්පතු ක්‍රම සමාගම.
2. කොළඹ ව්‍යාපාරය වස්තු හුවමාරුව
3. සන්රෙකෝ මැරීන් සමාගම
4. සෙලින්කෝ පී.එල්.සී.
5. සීමාසහිත බැලිබන් බිස්කට් සමාගම. (.....)

13. පහත ලක්ෂණ අතරින් සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට අයත් නොවන ලක්ෂණ තෝරන්න.

1. වෙළඳපොළ කුඩාවීම හා ආයෝජන ප්‍රාග්ධනය කුඩාවීම.
2. පවුලේ ශ්‍රමය අඩුවෙන් භාවිතා කිරීම.
3. අයිතිකරු ප්‍රධාන කළමනාකරුවීම හා කළමනාකරණය ස්වාධීන වීම.
4. නවීන තාක්ෂණය භාවිතය අඩුවීම හා මූල්‍ය බැඳීම් අඩුවීම.
5. දේශීය සම්පත් භාවිතය හා බොහෝවිට වෙළඳපල දේශීය වීම. (.....)

14. සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර දිරිමත් කිරීම සඳහා අනුග්‍රහය ලබාදෙන ආයතන x තීරුවෙන් හා එම ආයතන ලබාදෙන දිරිගැන්වීම් y තීරුවෙන්ද දැක්වේ.

	x තීරුව		**y තීරුව**
(i)	සර්වෝදය බැංකුව	A	ශ්‍රී ලංකා මහ බැංකුව
(ii)	සුරතුර	B	අන්තර් සහයෝගිතා සඳහා ජපන් බැංකුව
(iii)	ජාතික සංවර්ධන බැංකුව	C	සීඩ්ස්
(iv)	සුවන	D	සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය

ඉහත x හා y තීරුව නිවැරදිව ගැලපූ විට,

1. ABDC 2. ADBC 3.CABD 4. CBAD 5. BCAD (.....)

15. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා උපදේශන, පර්යේෂණ හා තාක්ෂණ, අලෙවි යටිතල පහසුකම් යන සියලු පහසුකම් සපයන ආයතනයක් වන්නේ,
   1. කාර්මික සංවර්ධන මණ්ඩලය
   2. නාගරික සංවර්ධන අධිකාරිය
   3. මහවැලි සංවර්ධන අධිකාරිය
   4. ජාතික මෝස්තර මධ්‍යස්ථානය
   5. අපනයන සංවර්ධන මණ්ඩලය (.....)

16. A - කාසි හා නෝට්ටු B - ඉතිරි කිරීමේ ගිණුම්වල ශේෂ
   C - ණය පත් හා හරපත් D - චෙක්පත්
   E - ජංගම ගිණුම්වල ශේෂ
   ඉහත සඳහන් දෑ අතරින් ආසන්න මුදල් ලෙස පිළිගත හැක්කේ,
   1. A හා B පමණි. 2. B පමණි. 3. A හා C පමණි. 4. B හා D පමණි. 5. A හා E පමණි. (.....)

17. චෙක්පතක ආදායකයාගේ නම යොදන ස්ථානයේ 'මුදල්' යන්න යොදා එම චෙක්පත මත 'ආදායකයාගේ ගිණුමට පමණයි.' යන රේඛණය ඇත්නම් එවැනි චෙක්පතකින් වැටහෙන්නේ,
   1. බැංකු කවුන්ටරයට දී මුදල් ලබාගත හැකි බවයි.
   2. ආදායකයාගේ ගිණුමට පමණක් බැරකළ යුතු බවයි.
   3. පිටසන් කිරීමෙන් ගණුදෙනු සඳහා යොදාගත හැකි බවයි.
   4. ගිණුමකට බැරකර මුදල් ලබාගත යුතු බවයි.
   5. වලංගු නොවන චෙක්පතක් බවයි. (.....)

18. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන සුරකුම්පත් නිෂ්කාෂණය සඳහා පමණක් හඳුන්වා දී ඇති නිශ්චිත ක්‍රමය හඳුන්වනුයේ,
   1. ලංකා සෙට්ල් (Lanka settle)
   2. ලංකා සෙක්‍යුර් (Lanka Secure)
   3. මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS)
   4. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය. (S LIPS)
   5. බ්‍රවුසර් වර්ක්ස්ටේෂන් (Browser workstation) (.....)

19. පහත වගුවේ දැක්වෙන්නේ රක්ෂණ මූලධර්ම හා ඒවායේ ලක්ෂණයන්ය.

	X		Y
A	රක්ෂණීය හිමිකම	1.	රක්ෂණය සුදුවකින් වෙනස්වීම.
B	උපරිම විශ්වාසය	2.	දේපළක් තිබීමෙන් වාසියක්ද නොතිබීමෙන් අවාසියක් ද වේ.
C	හානිපූරණය	3.	ආවරණය නොවූ අවදානමකට වන්දි හිමි නොවේ.
D	ආසන්නතම හේතුව	4.	රක්ෂකයා හා රක්ෂිතයා සියලු තොරතුරු සද්භාවයෙන් යුතුව හෙළිදරව් කිරීම.

   x හා y නිවැරදිව ගැලපූ විට පිළිතුර වනුයේ,
   1. A-2, B-4, C-1, D-3
   2. A-4, B-2, C-3, D-1
   3. A-3,B-1,C-4, D-2
   4. A-1, B-4, C-2,D-3
   5. A-4,B-3,C-2,D-1 (.....)

20. පෙරේරා විසින් පවත්වාගෙන ගිය පාවහන් වෙළෙඳසැල, සොරු බිඳීමක් මගින් විශාල අලාභයක් සිදුවූ අතර එම අවස්ථාවේ ඇතිවූ ගැටුමකින් සේවකයින්ටද තුවාල සිදුවිය. මෙම අලාභ රක්ෂණය මගින් ආවරණය කරගත හැකි බව ඔහු පවසයි. ඔහු ලබා ඇති රක්ෂණාවරණ වනුයේ,
   1. සොරබිය රක්ෂණය, පුද්ගල අහඹු රක්ෂණය
   2. සොරබිය රක්ෂණය, අනුෂාංගික අලාභ රක්ෂණය
   3. සේවක වගකීම් රක්ෂණය, සොරබිය රක්ෂණය
   4. නිෂ්පාදිත භාණ්ඩ වගකීම්, සොරබිය රක්ෂණය
   5. මහජන වගකීම් රක්ෂණය, සොරබිය රක්ෂණය. (.....)

21. පහත වගුවේ x තීරුවේ සන්නිවේදන මාධ්‍ය සහ y තීරුවේ සන්නිවේදන ක්‍රම සඳහන් වේ.

x		y
A	වාචික	1. ලිපිය
B	ලිඛිත	2. රැස්වීම්
C	විද්‍යුත්	3. හඬ තැපෑල
D	සංඥා හා සංකේ.	4. සීනුව
		5. මෙමෝ පත්‍ර
		6. රථවාහන හැසිරවීමේ විදුලි පහන්
		7. සාකච්ඡා
		8. පේජර් (pagers)

x හා y තීරු නිවැරදිව ගලපා ඇති කාණ්ඩය තෝරන්න.
1. A-2 සහ 7, B-1 සහ 5, C-3 සහ 8, D-4 සහ 6
2. A-2 සහ 3, B-1 සහ 8, C-4 සහ 7, D-5 සහ 6
3. A-2 සහ 7, B-1 සහ 5, C-6 සහ 8, D-3 සහ 4
4. A-2 සහ 8, B-1 සහ 5, C-3 සහ 7, D-4 සහ 6
5. A-1 සහ 7, B-2 සහ 5, C-3 සහ 8, D-4 සහ 6 (.....)

22. සන්නිවේදන මූලිකාංගයක් ලෙස ප්‍රතිපෝෂණයෙහි වැදගත්කම වන්නේ,
1. ලබන්නාට පණිවිඩය නිවැරදිව හා ඉක්මනින්ලබා දීමටය.
2. පණිවිඩය යැවීමට හේතුව දැණුම් දීමටය.
3. පණිවිඩය ලද බව හා තේරුම්ගත් බව තහවුරුකර ගැනීමටය.
4. පණිවිඩය වෙත ලබන්නාගේ අවධානයයොමු කිරීමටය.
5. කවුරුන් විසින් පණිවිඩය සන්නිවේදනය කරන්නේදැයි දැණුම් දීමටය. (.....)

23. දුරකථන ඇමතුමක යෙදී සිටියදී තවත් ඇමතුමක් එමින් තිබෙන බවට සංඥාවක් ලැබෙන පහසුකම හඳුන්වන්නේ,
1. අනුගාමීසේවා (call forwarding)
2. පොරොන්දු ඇමතුම් සේවා (call waiting)
3. සෙවි ඇමතුම් සේවා (Hunting Facilities)
4. කෙටි පණිවිඩ (SMS)
5. හඳුනාගැනීමේ සේවා (CLI) (.....)

24. ප්‍රවාහනයේ සමතුලිත සංවර්ධනයක් සඳහා අවශ්‍යවන්නේ,
1. වේගවත් හා සුරක්ෂිත ප්‍රවාහන ක්‍රම හඳුන්වාදීමයි.
2. මහා මාර්ග, දුම්රියමාර්ග හා ජල මාර්ග සංවර්ධනයකිරීමයි.
3. වරාය, ගුවන්තොටුපලවල්, බස් හා දුම්රිය නැවතුම්පළවල් සංවර්ධනය කිරීමයි.
4. ප්‍රවාහනය සඳහා බස්, ලොරි, දුම්රිය, ගුවන්යානා සහ නැව් යනාදිය වැඩියෙන් යෙදවීමයි.
5. මාර්ග, නැවතුම්පළවල්, රථවාහන සහ බලය සංවර්ධනය කිරීමයි. (.....)

25. හදිසි අවශ්‍යතා සඳහා වරායට සේන්දුවන නෞකා හඳුන්වන්නේ,
1. භාණ්ඩ නැව් (cargo vessles)
2. අබලන් නැව් (Damaged vessles)
3. ආධාරක නැව් (counter vessles)
4. බහාලුගත නැව් (container vessles)
5. ආකාෂ්මික නැව් (casual vessles) (.....)

26. දුම්රිය ප්‍රවාහනය තුළ දක්නට ලැබෙන ප්‍රධාන අවාසියක් වන්නේ,
1. ආරක්ෂාව නොමැති වීමයි.
2. නිතර පීලි පැනීමයි.
3. පිරිවැය අවම වීමයි.
4. ද්විත්ව ප්‍රවාහන පිරිවැයක් දැරියයුතු වීමයි.
5. වේගවත් නොවීමයි. (.....)

27. A, B,C, D අක්ෂරවලින් අන්තර්ජාතික වෙළඳමේ දී භාවිතා වන ලියවිලි ද, 1, 2, 3, 4 අංක මගින් එම ලියවිලි පිළිබඳ පැහැදිලි කිරීමක් ද දැක්වේ.

A	හානි රක්ෂණ ලිපිය	1.	ආනයන සටහන්කරය සකස් කිරීම සඳහා අවශ්‍ය භාවිත ලියවිලි ආනයනයකරුට ලැබී නොමැති අවස්ථාවකදී භාණ්ඩ පරීක්ෂා කර බැලීමට රේගු නිලධාරීන්ගෙන් අවසර ඉල්ලමින් සකස් කරන ලියවිල්ලයි.
B	ණයවර ලිපිය	2.	ලියවිලි රහිතව ආනයනයකරුට භාණ්ඩ බාර දීමෙන් නැව් සමාගමට යම් අලාභයක් සිදුවුවහොත් ආනයනයකරු හා ඔහුගේ බැංකුව ඒ සඳහා වගකීමෙන් බැඳෙන බව සහතික කරන ලියවිල්ලයි.
C	අවලෝකන පත	3.	ආනයනික භාණ්ඩවල වටිනාකම ගෙවන බවට පොරොන්දු වෙමින්, ආනයනයකරුගේ බැංකුව විසින් අපනයනකරුගේ බැංකුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ලයි.
D	හානි රක්ෂණ සහතිකය	4.	දූෂ්‍ය නෞභාරයක් වෙනුවෙන් පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීම සඳහා අපනයනයකරු නැව්පති වෙත නිකුත් කරන ලියවිල්ලයි.

මේවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

1. A-4, B-3, C-1, D-2 2. A-2, B-3, C-1, D-4 3. A-2, B-3, C-4, D-1
4. A-4, B-3, C-2, D-1 5. A-3, B-4, C-1,D-2 (.....)

28.

x තීරුව	**y තීරුව**
1. සෞඛ්‍ය සහතිකය	A වාණිජ දෙපාර්තමේන්තුව
2. ප්‍රභවස්ථාන සහතිකය	B සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුව
3. සනීපාරක්ෂක සහතිකය	C කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඇති පැළෑටි නිරෝධායන දෙපාර්තමේන්තුව

x තීරුවේ තොරතුරු y තීරුවේ තොරතුරු හා ගැළපූ විට නිවැරදි පිළිතුර වියයුත්තේ,

1. ACB 2. BCA 3. ABC 4. ACB 5. BAC (.....)

29. විද්‍යුත් සිල්ලර වෙළඳම සමකළ හැක්කේ,

1. ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට (Business to Business /B2B)
2. ව්‍යාපාරයෙන් ගනුදෙනුකරුට (Business to Customer /BC)
3. ගණුදෙනුකරුගෙන් ගනුදෙනුකරුට (Customer to Customer /C2C)
4. ගනුදෙනුකරුගෙන්ව්‍යාපාරයට (Customer to Business /C2B)
5. ව්‍යාපාරයෙන් රජයට (Business to Government /B2G) (.....)

30. තනි හිමිකාරත්වයක් යටතේ එක් වර්ගයකට අයත් භාණ්ඩ අලෙවි කිරීම සඳහා අග නගරයක ප්‍රධාන වෙළඳ සැල පිහිටුවා ප්‍රාදේශීය වශයෙන් ශාඛා පිහිටුවා ඇති වෙළඳසැල් හැඳින්වෙන්නේ,

1. සුපිරි වෙළඳ සැල් ලෙසය. 2. නානාංශ වෙළඳ සැල් ලෙසය.
3. ආංශික වෙළඳ සැල් ලෙසය. 4. විශේෂ වෙළඳ සැල් ලෙසය.
5. බැඳි වෙළඳ සැල් ලෙසය. (.....)

- **31 සිට 40 දක්වා වූ ප්‍රශ්න වලට සුදුසු වචනය, වාක්‍ය ඛණ්ඩය යොදා හිස්තැන මත ලියන්න.**

31. ශ්‍රී ලංකා මහ බැංකුව දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ධීවර කර්මාන්තය, කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ව නිෂ්පාදනයන් අයත් වනුයේ .... අංශයට වන අතර, විදුලිය, ගෑස්, ජලය ආදිය අයත් වනුයේ .... අංශයටයි.

32. යෙදවුම් නිමැවුම් ක්‍රියාවලියකදී කාලය, තොරතුරු, දැණුම යනාදිය ව්‍යාපාරයක.. ලෙස සැලකිය හැකිවන අතර මෙහෙයුම්, අලෙවිකරණය, මූල්‍ය කටයුතු යනාදිය .... ලෙස සැලකේ.

33. ආර්ථික වර්ධනයේදී .... අඛණ්ඩ ඉහළයාමක් පමණක් අපේක්ෂා කලද තිරසර සංවර්ධනයේදී එය සිදුවිය යුත්තේ .... සම්පත් සුරක්ෂිත කර දෙමිනි.

34. රජය විසින් ආර්ථිකය හැසිරවීම සඳහා .... හා .... යොදාගනු ලබයි.

35. සීමිත පොදු සමාගම් (අ) .... හා .... සමාගම් ලෙස කොටස්වන අතර රාජ්‍ය සමාගම් (ආ) .... යටතේ සංස්ථාපනය කර ඇති .... සමාගම් විශේෂයකි.

36. තමාම ව්‍යාපාරික ප්‍රතිවාදියා හා නවෝත්පාදකයා ලෙසින් ඉදිරිපත් වන්නා .... වන අතර සම්ප්‍රදාය ගරු කරන්නා හා ආරක්ෂාකාරීව ක්‍රියාකරන්නා (ආ) .... ලෙස හඳුන්වයි.

37. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා රජය දී ඇති දිරිගැන්වීම් වන ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීම (අ) .... දිරිගැන්වීම් වන අතර, විශිෂ්ඨතා සම්මාන ලබාදීම (ආ) .... දිරිගැන්විම් ලෙස හැඳින්වේ.

38. (අ) තීරුබදු නිදහස්කර ගැනීමේ අරමුණින් ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව හා මෙක්සිකෝව යන රටවල් විසින් .... ගිවිසුම ඇතිකර ගන්නා ලදී.
(ආ) මූල්‍ය හා තාක්ෂණික ආධාර ලබාදීමෙන් විනිමය අනුපාත හා ගෙවුම් ශේෂ නිරීක්ෂණය කිරීමෙන් ජාත්‍යන්තර සංවිධානය .... ලෙස හඳුන්වයි.

39. (අ) එක් ව්‍යාපාරිකයෙකු සතු විවිධ ස්ථානවල පිහිටි ගොඩනැගිලි කිහිපයක අන්තර්ගත චංචල හා ස්ථාවර වත්කම් සියල්ල ආවරණය කරමින් ලබාගත හැකි රක්ෂණ ඔප්පු විශේෂය .... ලෙස හඳුන්වනු ලැබේ.
(ආ) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වර්තමානයේ.. ලෙසට වෙනස්කොට ඇත.

40. (අ) තිරසර සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධනය වන රටවල දූප්පත්කම පහත හෙලීමේ අරමුණින් බ්‍රෙටන් වුඩ්ස් (Bretton woods) ගිවිසුම යටතේ 1945 දෙසැම්බර් 27 දින ආරම්භ කළ සංවර්ධනය වන රටවලට ණය සපයන බැංකුව .... ලෙස හඳුන්වයි.
(ආ) රටවල් කීපයක් විසින් බදු, තීරු ගාස්තු සහ වෙළඳම පිළිබඳව ගිවිසුමකට එළඹී නිදහස් වෙළඳ ප්‍රදේශයක් .... ලෙස හඳුන්වයි.

- **අංක 41 සිට 50 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවයන්ට හා පොදුවේ සමාජයට බලපෑම් ඇතිකරනු ලබන වර්ධනය වන බලවේග 4ක් සඳහන් කරන්න.

    1. ....
    2. ....
    3. ....
    4. ....

42. 4R සංකල්පයේ ප්‍රධාන කරුණු 4ක් සඳහන් කරන්න.

    1. ....
    2. ....
    3. ....
    4. ....

43. රජයේ බදු ආදායම සමන්විත වන බදු වර්ග 4ක් නම් කරන්න.

    1. ....
    2. ....
    3. ....
    4. ....

44. රජයේ බදු නොවන ආදායම් 4ක් සඳහන් කරන්න.

    1. ....
    2. ....
    3. ....
    4. ....

45. හවුල් ව්‍යාපාර නිර්වචනයට අනුව තිබිය යුතු අනිවාර්ය ලක්ෂණ 4ක් නම් කරන්න.

    1. ....
    2. ....
    3. ....
    4. ....

46. කේවල ස්වාමි ව්‍යාපාරයක් හා හවුල් ව්‍යාපාර සසඳන විට දැකිය හැකි සමානතා හතරක් නම් කරන්න.

    1. ....
    2. ....
    3. ....
    4. ....

47. ව්‍යවසායකත්ව කුලසතා නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

48. විද්‍යුත් මුදලින් ගනුදෙනු පියවීමේදී සම්බන්ධවන පාර්ශව හතරක් නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

49. සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගමේ කාර්යයන් අතරින් චෙක්පත් නිෂ්කාශන පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

50. දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයේ (SAARC) කටයුතු ක්ෂේත්‍ර පහක් යටතේ සිදුවේ. ඒවා නම් කරන්න.

1. ....

2. ....

3. ....

4. ....

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

32	S	II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 12 - 2019

විභාග අංකය .... **ව්‍යාපාර අධ්‍යයනය II** කාලය පැය තුනයි

උපදෙස්

♦ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

I කොටස

01. (i) (අ) පුද්ගල විශේෂීකරණය හා ප්‍රාදේශීය විශේෂීකරණය යන්නෙහි වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) ප්‍රචලිත සමාගම් නාමයන් ඇසුරෙන් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර සඳහා හා සේවා නිෂ්පාදන ව්‍යාපාර සඳහා උදාහරණ 4 බැගින් සපයන්න. (ලකුණු 2)
(ii) ගෝලීයකරණය ව්‍යාපාරයකට අභියෝගයක් වියහැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)
(iii) විද්‍යුත් ව්‍යාපාර යනු කුමක්දැයි හඳුන්වා විද්‍යුත් ව්‍යාපාරයක දැකිය හැකි වාසි 2ක් සඳහන් කරන්න.(ල. 4)
(iv) (අ) ATM පහසුකම පමණක් සහිත කාඩ්පතක් විද්‍යුත් මුදල් ලෙස සැලකිය හැකිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) ව්‍යාපාරයක තොරතුරු කළමණාකරණ කටයුතු 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(v) අයිතිකරුවන් හා කළමණාකරුවන් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතු 4 බැගින් සඳහන් කරන්න. (ලකුණු 4)

02. (i) (අ) සාර්ව පරිසරය තුළ අන්තර්ගත විය හැකි පරිසර සාධක 8ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) Reuse හෙවත් නැවත නැවත භාවිතා කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ii) ව්‍යාපාර කටයුතුවල දැකිය හැකි අහිතකර බලපෑම් 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)
(iii) ව්‍යාපාර ආචාර ධර්ම යන්න නිර්වචනය කොට ආචාරධර්ම පද්ධතියක් සැකසීමේදී සලකා බැලිය යුතු කරුණු 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)
(iv) (අ) ආචාර ධර්ම පද්ධතියක් සැකසීමේදී තරඟකරුවන් පිළිබඳව සැලකිලිමත් විය යුත්තේ කෙසේද?(ල. 2)
(ආ) අලෙවිකරණ ආචාරධර්ම පිළිබඳව තුළින් ව්‍යාපාරයකට අත්වන වාසි 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(v) රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය යන්න පැහැදිලි කර රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනය සඳහන් කරන්න. (ලකුණු 4)

03. (i) (අ) නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හඳුන්වන්න. (ලකුණු 2)
(ආ) බැංකු පොලී අනුපාතිකය යන්න හඳුන්වන්න. (ලකුණු 2)
(ii) ප්‍රමාණාත්මක ණය සීමා පැනවීමයන්නනිර්වචනය කොට උදාහරණ 2ක් සපයන්න. (ලකුණු 4)
(iii) විදේශ වෙළඳපොළ ජයගැනීම සඳහා ප්‍රමිති ලබාගැනීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 4)
(iv) (අ) නුවන් ස්ටෝර්ස්, ගයාන් සහ පුත්‍රයෝ යන ව්‍යාපාර කුමන ව්‍යාපාර සංවිධාන වලට අයත්දැයි නම්කර එම ව්‍යාපාර සංවිධාන වර්ගවල සමානකම් 4ක් දක්වන්න. (ලකුණු 2)
(ආ) සංඛ තම අතිරික්ත මුදල් ඵලදායී ආයෝජන මාර්ගයක ආයෝජනය කිරීමට සිතයි. මෙහිදී බොහෝ විකල්ප ආයෝජන මාර්ග තම මිතුරා දැක්වූ අතර ඔහුගේ මතය සංස්ථාපිත සමාගම්වල අවාසි වලට වඩා වාසි ඇති බවයි. මේ පිළිබඳ ඔබේ අදහස් සංඛට ඉදිරිපත් කරන්න. (ලකුණු 2)
(v) අනිකුත් ව්‍යාපාර සංවිධාන මෙන් සමුපකාරද විවිධ ක්ෂේත්‍ර යටතේ ආරම්භ කර ඇත. එලෙස අරඹා ඇති සමුපකාර 4ක් නම් කරන්න. (ලකුණු 4)

04. (i) (අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාගැනීමේදී ඒ සඳහා යොදාගන්නා රාජ්‍ය සංස්ථා විවිධ නම් යටතේ පෙනී සිටී. මෙම විවිධ නම් හා ඒසඳහා උදාහරණද දක්වන්න. (ලකුණු 2)
(ආ) ඉහත දැක්වූ රාජ්‍ය සංස්ථා පිහිටුවියහැකි ආකාර දෙක නම්කර ඒ සඳහා උදාහරණ 1 බැගින් දෙන්න. (ලකුණු 2)

(ii) (අ) රාජ්‍ය අංශයේ හෙවත් පොදු අංශයේ ව්‍යාපාර සංවිධාන හඳුන්වන්න. (ලකුණු 2)
(ආ) පොදු අංශය යටතේ ව්‍යාපාර පවත්වාගෙන යාමටහේතු 4ක් ලියන්න. (ලකුණු 2)

(iii) (අ) රාජ්‍ය සංස්ථා හා රාජ්‍ය සමාගම් පහත ලක්ෂණ යටතේ සසඳන්න.
1. සාමාජිකත්වය 2. කළමණාකරණය 3. වගකීම් 4. නෛතික පුද්ගල බව (ලකුණු 2)
(ආ) ව්‍යවසායකත්වය තුළ නව්‍යතා, ව්‍යාපාර අවස්ථා හා නිර්මාණශීලීත්වය ගැබ්ව ඇතිබැවින් ව්‍යවසායකත්වය ව්‍යාපාරවලින් වෙනස් වේ.
ඉහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ''ව්‍යවසායකත්වය'' පිළිබඳ ඔබ අර්ථකථනයක් ගොඩනගන්න. (ලකුණු 2)

(iv) (අ) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනය උදෙසා ව්‍යාපාරවලට වඩා ව්‍යවසායකත්වය යටතේ පවත්වාගෙන යන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැදගත් වේ. මෙයට පක්ෂව කරුණු 4ක් දක්වන්න. (ලකුණු 2)
(ආ) සංවිධානයක් තුළ ක්‍රියාත්මක වන සංවිධානයක වෙනස්කම් හඳුන්වාදෙන ව්‍යවසායකත්වය හඳුන්වන්නේ කුමන නමින්ද? එම ව්‍යවසායකත්වය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

(v) නව්‍යතා ගොඩනැගීම→(1).................................→අවශ්‍ය සම්පත් සම්පාදනය→(2) ....

(3) ....←

ඉහත ව්‍යවසායකත්ව ක්‍රියාවලියට අයත් නිවැරදි පියවරයන් හිස්තැන්වලයොදන්න. (ලකුණු 2) ව්‍යවසායකත්ව ක්‍රියාවලිය කෙටියෙන් හඳුන්වන්න (ලකුණු 2)

II - කොටස

05. (i) (අ) ''ස්වාධීනව අයිතිය හා ස්වාධීනව ක්‍රියාත්මක වන එසේම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නොවූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ.'' කුඩා ව්‍යාපාර සම්බන්ධ ඉහත නිර්වචනය ඉදිරිපත් කර ඇති ආයතනය දක්වන්න. (ලකුණු 1)
(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායකවන ආකාරය කරුණු 4ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 3)

(ii) (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නංවාලීම සඳහා දිරිගැන්වීම් ලබාදෙන පහත දක්වන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙන්කර දක්වන්න.
කාර්මික සංවර්ධන මණ්ඩලය, ජාතිකසංවර්ධන බැංකුව, සණස කාර්මික තාක්ෂණ ආයතනය, සර්වෝද, ජයිකා (ලකුණු 2)
(ආ) මෙම ආයතන වලින් කාර්මික සංවර්ධන මණ්ඩලය හා කාර්මික තාක්ෂණ ආයතනය ලබාදෙන දිරිගැන්වීම් 2 බැගින් ලියන්න. (ලකුණු 3)

(iii) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව රජය වෙනුවෙන් නොයෙකුත් කාර්යයන් ඉටුකරයි. එම නිසා මෙය රජයේ බැංකුව ලෙස හඳුන්වයි. රජයේ බැංකුව ලෙස හැඳින්වීමට හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)
(ආ) චෙක්පතේ ආරක්ෂාව සඳහා රේඛනය භාවිතාකරයි. චෙක්පත් රේඛන වර්ග උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 2)

(iv) සඳුනිට බැංකු ගිණුම් පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැත. ඇය පෞද්ගලික ආයතනයක දෛනික පදනම මත දින කිහිපයක් සේවය කළ පසු ආයතනය විසින් රු. 5000/= ක චෙක්පතක් ඇයට ලබාදුන් අතර එය ආදායකයාගේ ගිණුමට පමණයි යන්නද සඳහන් රේඛිත චෙක්පතක් විය.
ව්‍යාපාර අධ්‍යයනය හදාරණ සිසුවෙකු ලෙස ඔබ සඳුනිට චෙක්පතට මුදල් ලබාගැනීම සඳහා උපදෙස් ලබා දෙන්න. (ලකුණු 4)

(v) (අ) චෙක්පතක් ආරක්ෂාව සඳහා චෙක්පත් රේඛනය කළහැකි අතරම එම රේඛනයන් අවලංගු කිරීමද කළ හැකිය. චෙක්පත් රේඛනය කළ හැකි පාර්ශව හා අවලංගු කළ හැකි පාර්ශවයන් කවරේද? (ලකුණු 2)
(ආ) බැංකුවක් විසින් චෙක්පත් මිලදී ගැනීම යනු කුමක්ද? (ලකුණු 2)

06. (i) (අ) ජංගම ගිණුම් හිමියෙකුට ලබාගත හැකි ප්‍රයෝජන අතර බැංකු අයිරා පහසුකම් වැදගත් වේ. බැංකු අයිරා පහසුකම් යනු කුමක්ද? (ලකුණු 2)
(ආ) බැංකු අයිරා වර්ග නම්කර පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ii) (අ) වර්තමාන සමාජයේ නාගරික මෙන්ම ග්‍රාමීය ජනතාවද බැංකු ගණුදෙනු කෙරෙහි යොමු කිරිමට සමත් මූලය ආයතනයක් වන සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති (සණස) හඳුන්වා, ඒවායේ කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) ණය කාඩ්පත් හා හර කාඩ්පත් යනු මොනවාදැයි හඳුන්වා ඒවා අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) (අ) රක්ෂණය පදනම් වී ඇති මූලධර්මය වන්නේ 'අවදානම් ඒකරාශීකරණය' පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) ව්‍යාපාරික අවදානම් රක්ෂණය කළහැකි අවදානම් සහ රක්ෂණය කළ නොහැකි අවදානම් ලෙස වර්ග කළ හැක. රක්ෂණය කළ හැකි අවදානමක තිබිය යුතු ලක්ෂණ මොනවාද? (ලකුණු 2)

(iv) (අ) රක්ෂණය ක්‍රියාත්මක වනුයේ මූලධර්ම සමූහයක් පදනම් කරගෙනය. එවැනි මූලධර්ම නම්කර උපරිම විශ්වාසය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(v) (ආ) සපලදායී සන්නිවේදනයක් සඳහා පණිවිඩය යවන්නා හා ලබන්නා විසින් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග කවරේද? (ලකුණු 2)
(ආ) ව්‍යාපාර ආයතනයක් හා බාහිර පාර්ශවයන් අතර තොරතුරු හා අදහස් හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය බාහිර සන්නිවේදනයයි. හොඳ බාහිර සන්නිවේදනයක ප්‍රතිලාභ කවරේද? (ලකුණු 2)

07. (i) (අ) සන්නිවේදන ක්‍රියාවලියේ අන්තර්ගත ප්‍රතිචාරය සහ ප්‍රතිපෝෂණය වෙන් වෙන්ව හඳුන්වන්න.(ල. 2)
(ආ) ව්‍යාපාර කටයුතු සඳහාසන්නිවේදනය වැදගත්වන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ල. 2)

(ii) (අ) සන්නිවේදනය වර්ග කළ හැකි විවිධ පදනම් 4ක් නම් කරන්න. (ලකුණු 2)
(ආ) පණිවිඩයක තිබිය යුතු මූලික ගුණාංග ඇතුළත් ග්‍රාහකයාගෙන් ක්ෂණිකව අපේක්ෂිත ප්‍රතිචාරයක් ලබාගතහැකි සන්නිවේදන බාධාවලින් තොර සන්නිවේදනය සඵලදායී සන්නිවේදනයයි. එවැනි සන්නිවේදනයකට ඇති බාධා කවරේද? (ලකුණු 2)

(iii) (අ) ප්‍රවාහන හා සැපයුම් සේවා යනු කුමක්දැයි අර්ථකථනය කරන්න. (ලකුණු 2)
(ආ) ආයතනවල ස්වරූපය හා නිෂ්පාදිතවල ස්වරූපය අනුව ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති විවිධ වේ. එම පද්ධති දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(iv) (අ) ශ්‍රී ලංකාවේ මහා මාර්ග ප්‍රවාහනයේදී මෝටර් රථයක් ධාවනයේ යෙදවීමටපෙර ඉටුකළ යුතු නීතිමය අවශ්‍යතා කවරේද? (ලකුණු 2)
(ආ) විදේශ සංචාරයක් සඳහා පුද්ගලයෙකු අනිවාර්යයෙන් ලබාගත යුතු ලියවිලි කවරේද? (ලකුණු 2)

(v) (අ) පොදු ප්‍රවාහන සේවා භාවිතා කරන මගීන්ගේ අයිතිවාසිකම් කවරේද? (ලකුණු 2)
(ආ) නව මෝටර් රථයක් ලියාපදිංචි කරන්නේ කෙසේද? (ලකුණු 2)

08. (i) (අ) නිෂ්පාදිත බෙදා හැරීමේ මාර්ගයේ නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර සිටින බෙදාහැරීමේ ක්‍රියාවලියට සම්බන්ධවන පාර්ශවයන් අතරමැදියන් වේ. අතරමැදියන් යොදා ගැනිමේ වාසි 2ක් හා අවාසි 2ක් දක්වන්න. (ලකුණු 2)
(ආ) තොග වෙළෙන්දාගෙන් නිස්පාදකයාටත්, සිල්ලර වෙළෙන්දාටත් යන දෙපාර්ශවයටම යම් යම් සේවාවන් ඉටුවේ. මෙම පාර්ශවයන්ට ඉටුවනසේවා 2 බැගින් දක්වන්න. (ලකුණු 2)

(ii) (අ) විදේශ වෙළඳමට පදනම් වී ඇති සාධක 4ක් දක්වන්න. (ලකුණු 2)
(ආ) විදේශ වෙළඳමේදී මුදල් ගෙවීම සඳහා යොදා ගන්නා ක්‍රම 4ක් දක්වන්න. (ලකුණු 2)

(iii) (අ) ප්‍රති අපනයනය හා අන්තරාල වෙළඳම අතර වෙනස නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) රටක් විදේශ වෙළඳමේ නිරත වීමෙන් අත්කරගත හැකි ප්‍රතිලාභ 4ක් දක්වන්න. (ලකුණු 2)

(iv) කුරුඳු වගාකරුවෙකු වු ගිහාන් තම නිෂ්පාදිත දේශීය වෙළඳපලට සපයන අතර, ඔහුගේ මිතුරකු වන ෂෙහාන් එම නිෂ්පාදිත විදේශ වෙළඳපලට සැපයීමෙන් විදේහ විනිමය උපයාගත හැකි බව ඔහුට පවසයි. එසේවුවද ගිහාන්ට මෙන්ම ෂෙහාන්ටද මෙහිදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් නැත.
ඉහත සිද්ධියටඅනුවගිහාන්අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය ඔබ විසින් අනුපිළිවෙළින් විස්තර කරන්න. (ලකුණු 4)

(v) (අ) නිදහස් වෙළඳමට බලපාන තීරු බදු නොවන බාධා 4ක් දක්වන්න. (ලකුණු 2)
(ආ) නිදහස් වෙළඳ කලාපයක් යනු කුමක්දැයි හඳුන්වා ඊට නිදසුන් 2ක් දක්වන්න. (ලකුණු 2)

ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු පත්‍රය
තෙවන වාර පරීක්ෂණය - 2019
12 ශ්‍රේණිය

I පත්‍රය

1 -5	11 -3	21 -1
2 -3	12 -2	22 - 3
3 -1	13 -2	23 - 2
4 -4	14 -3	24 - 5
5 -2	15 - 1	25 - 5
6 - 2	16 - 2	26 - 4
7 - 5	17 - 5	27 - 1
8 -1	18 - 2	28 - 5
9 - 3	19 - 1	29 - 2
10 - 3	20 - 3	30 - 2

31. කෘෂිකාර්මික,කර්මාන්ත
32. යෙදවුම්,ව්‍යාපාර කාර්යයන්
33. දළ දේශීය නිෂ්පාදනය, අනාගත පරම්පරාවට
34. මූල්‍ය ප්‍රතිපත්තිය,පිස්කල් ප්‍රතිපත්තිය
35. (අ) ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ
    (ආ)2007 සමාගම් පනත,සීමිත පොදු
36. (අ) ව්‍යවසායකයා (ආ)ව්‍යාපාරිකයා
37. (අ) මූල්‍යමය (ආ)මූල්‍යමය නොවන
38. (අ)උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම (NAFTA)
    (ආ)ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
39. (අ) බලැන්කට් ඔප්පුව (ආ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
40. (අ) ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (ලෝක බැංකුව)
    (ආ)වෙළඳ කලාප(Trade Bloc)/වෙළඳ හවුල්/වෙළඳ සංගම්
41. 1.ව්‍යාපාර තරඟය 2. ගෝලියකරණය 3.විද්‍යුත් ව්‍යාපාර 4.පරිසර දූෂණය
42. 1.Recycle(ප්‍රතිචක්‍රීයකරණය) 2.Reuse(නැවත භාවිතය)
    3.Reduse (භාවිතය අඩු කිරීම) 4.Replace(නැවත ස්ථාපිත කිරීම)
43. 1.ආදායම් බදු 2.එකතු කළ අගය මත බදු 3.නිෂ්පාදන බදු 4. ආනයන බදු
44. 1.ලාභ හා ලාභාංශ 2.ගාස්තු හා අය කිරීම් 3.පොලී ආදායම් 4.ලොතරැයි ආදායම් වැනි වෙනත් ආදායම්
45. 1.ලාභ ලැබීමේ අරමුණක් තිබීම 2.ව්‍යාපාර කටයුත්තක් පැවතීම
    3.පුද්ගලයින් සිටීම 4.අන්‍යෝන්‍ය එකඟතාවයක් තිබීම
46. 1.ලියාපදිංචිය අනිවාර්ය නොවීම 2. වගකීම අසීමිත වීම
    3 .නෛතික පුද්ගලභාවයක් නොමැති වීම 4.අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
47. 1.නායකත්ව කුසලතා 2.අන්තර් පුද්ගල හැකියා
    3.සන්නිවේදන කුසලතා 4.මූලික කළමනාකරණ කුසලතා
48. 1කාඩ්පත් හිමියා 2.කාඩ්පත් නිකුත් කරන ආයතනය 3.වෙළෙන්දා හෙවත් විකුණුම්කරු 4.ණයපත් සංගමය
49. 1චෙක්පත් හා අණ කර වර්ග කිරීම 2.සහභාගීත්ව බැංකු අතර, චෙක්පත් හා අණකර හුවමාරු කිරීම
    3.වටිනාකම් තුලනය කොට ශුද්ධ ශේෂය ගණනය කිරීම 4.ශුද්ධ ශේෂය වාණිජ බැංකු හා මහ බැංකුව වෙත දැනුම්
50. 1.කෘෂිකර්මාන්තය හා ග්‍රාමීය සංවර්ධනය 2.විදුලි සංදේශ,විද්‍යාව,තාක්ෂණය හා දේශගුණික විද්‍යාව
    3 සෞඛ්‍ය හා ජනගහණ කටයුතු 4 .ප්‍රවාහනය 5.මානව සම්පත් සංවර්ධනය

ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු පත්‍රය
තෙවන වාර පරීක්ෂණය - 2019
12 ශ්‍රේණිය

II පත්‍රය

1.

i. (අ) යම් පුද්ගලයෙකු තමන්ට වඩාත් හොඳින් නිරත විය හැකි කාර්යයෙහි පමණක් දිගින් දිගටම නිරත වීම පුද්ගල විශේෂීකරණයයි.

උදා - වඩුවා,විදුලි කාර්මිකයා

යම් යම් ප්‍රදේශ යම් සුවිශේෂී කර්මාන්තයක් වඩාත් හොඳින් දීර්ඝකාලීනව ඉටු කිරීම හරහා එහි කර්මාන්තයන්ට ප්‍රචලිත වීම ප්‍රාදේශීය විශේෂීකරණයයි.

උදා-පිළිම තලාව - පිත්තල කර්මාන්තය , අම්බලන්ගොඩ - වෙස් මුහුණු කර්මාන්තය

(නිවැරදි නිර්වචන දෙකට ලකුණු 02)

(ආ) ගැලපෙන උදාහරණ 08 ක් සඳහා ලකුණු 02 කි.

ii.

- ❖ විදේශීය නිෂ්පාදන සමඟ තරඟ කිරීමට සිදු වීම
- ❖ බොහෝ විදේශීය නිෂ්පාදන වල මිල අඩු වීම නිසා තරඟ කිරීම අපහසු වීම
- ❖ දේශීය වෙළඳපල කොටස අහිමි වීම
- ❖ අඩු පිරිවැය ශ්‍රමය හා නවීන තාක්ෂණය යොදා ගනු ලබන ව්‍යාපාර සමඟ තරඟ කිරීම පහසු නොවීම

(ඉහත කරුණු ද ඇතුළත් ගැලපෙන පැහැදිලි කිරීමකට ලකුණු 04 යි)

iii.

සියලුම ව්‍යාපාර කටයුතු තොරතුරු තාක්ෂණය හා නවීන තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ සිදු කරනු ලබන ව්‍යාපාර විද්‍යුත් ව්‍යාපාර වේ. (ලකුණු 02)

<u>වාසි</u>

- ❖ ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම වීම
- ❖ ඵලදායිතාව ඉහළ යාම
- ❖ ලිඛිත කාර්යයන් හා ලිපි ද්‍රව්‍ය භාවිතය අවම වීම
- ❖ පිරිවැය අවම වීම (ගැලපෙන වාසි 02 කට ලකුණු 02)

iv. (අ) විද්‍යුත් මුදල් ලෙස සැලකිය නොහැක.ඊට හේතුව වන්නේ එහි සෘජුවම ගණුදෙණු වලදී හුවමාරු මාධ්‍යන් ලෙස යොදා ගත නොහැකි වීමයි. (ලකුණු 02)

(ආ)

- ❖ නව තොරතුරු පද්ධති ඇති කිරීම
- ❖ නව තොරතුරු සම්පාදනය කිරීම
- ❖ තොරතුරු හා එම පද්ධතීන් යාවත්කාලීන කිරීම
- ❖ තොරතුරු පද්ධතීන් නඩත්තුව හා පවත්වාගෙන යාම
- ❖ අවශ්‍ය පාර්ශව වෙත කලට වේලාවට අවශ්‍ය තොරතුරු බෙදා හැරීම (කරුණු 04 කට ලකුණු 02)

v. <u>අයිතිකරුවන්</u>

- ❖ ආයෝජනය කළ මුදලට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබේදැයි දැන ගැනීමට
- ❖ වෙළඳපොල කොටස් දැනගැනීමට
- ❖ ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ දැනගැනීමට
- ❖ යෙද වූ මුදලේ ආරක්ෂාව පිළිබඳ දැනගැනීමට (ලකුණු 02)

<u>කළමණාකරුවන්</u>

- ❖ ව්‍යාපාර වර්ධනය පිළිබඳව දැන ගැනීමට
- ❖ ලාභ උපරිම කිරීමට
- ❖ කළමණාකරණ තීරණවල සාර්ථක අසාර්ථක බව දැන ගැනීමට
- ❖ වෘත්තීය දියුණුව උදෙසා (ලකුණු 02)

2. I (අ)

- ආර්ථික පරිසරය
- ▪ නෛතික පරිසරය
- ▪ තාක්ෂණික පරිසරය
- ▪ සමාජ හා සංස්කෘතික පරිසරය
- ▪ ගෝලීය පරිසරය
- ▪ දේශපාලන පරිසරය
- ▪ ප්‍රජා පරිසරය
- ▪ ස්භාවික පරිසරය (කරුණු 08 කට ලකුණු 02)

(ආ) නිෂ්පාදනයේ දී හෝ පාරිභෝජනයේ දී නැවත භාවිත කළ හැකි දේ යොදා ගැනීම මින් අදහස් කෙරේ.(ලකුණු 02)

ii

- වැඩි ලාභ උදෙසා ගුණත්වයෙන් අඩු භාණ්ඩ නිෂ්පාදනය
- පාරිභෝගිකයින් රැවටීම.
- සේවක සුභ සාධනය අඩු වීම.
- ස්භාවික සම්පත් අපතේ හැරීම.
- පරිසර දූෂණය සිදු කිරීම.
- රටට,සංස්කෘතියට නොගැළපෙන වෙළඳ දැන්වීම් නිර්මාණය
- සමාජ සංස්කෘතියට නොගැළපෙන ඇඳුම් විලාසිතා නිර්මාණය (කරුණු 04කට ලකුණු 04යි)

iii. ව්‍යාපාර තමන් සමග කටයුතු කරන සියලු පාර්ශවයන්ට යහපතක් සිදුවන ආකාරයට හොඳ නරක පිළිබඳව අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම ව්‍යාපාර ආචාර ධර්ම වේ. (ලකුණු 02)

- ව්‍යාපාරය
- සේවකයින්
- සමාජ සංස්කෘතිය
- ප්‍රායෝගික බව
- ගණුදෙනුකරුවන්
- තරඟකරුවන්
- සංවිධාන සංස්කෘතිය (කරුණු 04කට ලකුණු 02)
-

iv. (අ) තරඟකරුවන් සිටී ද? ඔවුන් අනුගමනය කරන ආචාර ධර්ම මොනවා ද යනාදිය පිළිබඳව සැලකිලිමත් විය යුතු ය. (ලකුණු 02යි)

(ආ)

- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම.
- තරඟකාරීත්වයට සාර්ථක ලෙස මුහුණ දිය හැකි වීම. (ගැලපෙන වාසි 02කට ලකුණු 02යි)
-

v. රටේ මුදල් සැපයුම පාලනය සඳහා රජය විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රතිපත්තිය නම් වේ. (ලකුණු 03)
ශ්‍රී ලංකා මහ බැංකුව (ලකුණු 01)

3.

i.. (අ) වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළඳුන් ඔවුන්ගේ අතිරික්ත මුදල් මහ බැංකුවේ ඇති රජයේ සුරුකුම්පත්වල ආයෝජනය කිරීමේදී ගෙවනු ලබන පොලී අනුපාතිකයකි. (ලකුණු 02)

(ආ) ද්‍රවශීලතා දුෂ්කරතාවලට මුහුණු දෙන වාණිජ බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව අවසන් ණය දෙන්නා ලෙස සපයනු ලබන ණය සඳහා අයකරනු ලබන පොලී අනුපාතිකයයි. (ලකුණු 02යි)

ii. ප්‍රමාණාත්මක ණය සීමා පැනවීම යනු රටේ සමස්ථ මුදල් සැපයුමට බලපෑම් ඇති කරනු ලබන බැංකු ණය ප්‍රමාණය අඩු හා වැඩි කරමින් සමස්ථ ණය ප්‍රමාණය පාලනය කිරීමයි. (ලකුණු 02යි)

උදා :-

- වාණිජ බැංකු වල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාතික නියම කිරීම
- ණයවර ලිපි නිකුත් කිරීමේ දී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණය තීරණය කිරීම (ලකුණු 02)

iii. දේශීය ප්‍රමිත ලාංඡන (SLS) සඳහා ඇති විදේශීය පිළි ගැනීම අඩු මට්ටමක පවතින නමුත් ISO වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනය කිරීමෙන් විදේශ වෙළඳපළ තුළද විදේශීය පාරිභෝගිකයින්ගේ විශ්වාසය දිනා ගත හැක.එම නිසා විදේශ වෙළඳපළ තුළ හොඳ පාරිභෝගික කොටසක් දිනා ගැනීමටත් උපරිම ලාභ ලැබීමටත් හැකිවනු ඇත.මේ නිසා ISO වැනි ජාත්‍යන්තර ප්‍රමිත භාවිතය විදේශීය වෙළඳපළ ජය ගැනීමට ඉවහල් වනු ඇත. (ලකුණු 04)

iv. (අ) කේවල ස්වාමි/තනි/ඒක පුද්ගල ව්‍යාපාර/හවුල් ව්‍යාපාර

<u>සමාන ලක්ෂණ</u>

- කුඩා ප්‍රාග්ධනයකින් ඇරඹීම
- වගකීම අසීමිත වීම
- නෛතික පුද්ගලයින් නොමැතිකම
- අඛණ්ඩ පැවැත්මක් නැත

(ලක්ෂණ 4ක් දක්වා ඇති නම් හා නිවැරදිව නම් කර ඇත් නම් ලකුණු 01ක් ද කරුණු 4 දක්වා ඇත්නම් ලකුණු 01 බැගින් ලකුණු 02 කි)

(ආ)

වාසි	අවාසි
• නෛතික පුද්ගල බව	• නීතිමය බැඳීම් වැඩි වීම
• අඛණ්ඩ පැවැත්ම	• ගිණුම් තැබීම අනිවාර්ය වීම
• වගකීම සීමිත වීම	• සුලු කොටස් හිමියන්ට වැඩි බලයක් හිමි නොවීම
• විශාල ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම	• ආරම්භය මෙන්ම අවසානය සංකීර්ණ වීම
• පිළි ගැනීම	• ලාභාංශ මත බදු ගෙවීම

(වාසි 02 ක් හා අවාසි 02 ක් නම් කර ඇත්නම් කරුණකට ලකුණු ½ බැලින් ලකුණු 02)

v. (අ)

- විවිධ සේවා සමූපකාර සමිති
- සකසුරුවම් හා ණය දෙන සමිති
- ධීවර සමූපකාර සමිති
- පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිති
- ගොවි ද්‍රව්‍ය නිෂ්පාදකයින්ගේ සමූකාර සමිති (කරුණු 4 ම දක්වා ඇත්නම් ලකුණු ½ බැගින් ලකුණු 02යි)

(ආ)

- පෞද්ගලික අංශයේ,විශේෂිත ව්‍යාපාර ගණයට (ලකුණු 01 යි)
- වරලත් හිමියා හා ලාභියා අතර
- මූල්‍ය කොන්දේසි,ගෙවිය යුතු මූලික ගාස්තු හා නීති රීති (ලකුණු 01)

4.

i.(අ)

- මණ්ඩල - ගමනාගමන මණ්ඩලය,පශු සම්පත් මණ්ඩලය
- සංස්ථා - ධීවර,රක්ෂණ,පිගන්
- සභා - තරුණ සේවා සභාව
- අධිකාරය - පාරිභෝගික කටයුතු පිළිබද අධිකාරය,වරාය අධිකාරය
- කොමිෂන් සභා - අධිකරණ කොමිෂන් සභාව

(කරුණු 4 නිවැරදිව ගලපා ඇත්නම් එක් කරුණකට ½ බැගින් ලකුණු 02 යි)

(ආ)

විශේෂ පනත්	පොදු පනත්
• 2003 අංක 09 පාරිභෝගික කටයුතු අධිකාරය	• 1957 අංක 498 දරණ පනත යටතේ
	➢ ලංකා තුනී ලැලි සංස්ථාව
	➢ සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

ii. (අ)රජය හෝ පළාත් පාලන ආයතනයක් විසින් පවත්වාගෙන යන හා පාලනය කෙරෙන සියලුම ව්‍යාපාරයි.(ලකුණු 02)

(ආ)

- ඒකාධිකාරය පාලනය කිරීම
- ලාභදායි නොවන මහජනයාට අත්‍යවශය සේවා පවත්වාගෙන යාම
- වැදගත් මහා පරිමාණ සංවර්ධන ක්‍රම පවත්වාගෙන යාම
- සම්පත් නාස්තිය අවම කර ගැනීමට (කරුණු 04 ට ලකුණු ½ බැගින් ලකුණු 02 යි)

iii. (අ)

සංස්ථා	සමාගම්
• අවම 01යි උපරිම සීමාවන් නැත	• අවමය එකකි.උපරිමය අසීමිතයි
• විෂයභාර ඇමති පත් කළ අධ්‍යක්ෂ මණ්ඩල මගින්	• කොටස්කරුවන්ගෙන් තේරු අධ්‍යක්ෂමණ්ඩලය
• වගකීම සීමිතයි	• වගකීම සීමිතයි
• නෛතික පුද්ගල බව ඇත	• නෛතික පුද්ගල බව ඇත

ආ) "අවස්ථා නිර්මාණශීලීව උකහා ගනිමින් අවදානමක් දරා නවෝත්පාදන බිහි කිරීමේ ක්‍රියාවලිය"

iv.

1. තරඟකාරි ව්‍යාපාර ලොව රැදීමට
2. වෙනස්කම් වලට ප්‍රති ක්‍රියා දක්වමින් නව නිෂ්පාදන බිහි වීම නිසා
3. ජීවන තත්ත්වය උසස් කිරීමට නවෝත්පාදන බිහි වීම
4. නව වෙළඳපොළ සංවර්ධනය
5. ප්‍රාදේශීය සම්පත් භාවිතය තුල නව නිෂ්පාදන බිහි වීම

(ආ)

- අභ්‍යන්තර ව්‍යවසායකත්වය
- සංවිධානවල විවිධ තනතුරුවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයින් එම ආයතන වල නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රම වල වෙනස්කම් සිදු කරයි. ඉහළ කළමනාකරුවන් නිර්මාණ ශීලීව කටයුතු කිරීමට මොවුන් දිරි ගැන්වීමයි.

v. 1.සංකල්ප ගොඩ නැංවීම
2.යථාර්තයක් බවට පත් කිරීම
3.ප්‍රතිලාභ ලැබීම

- ව්‍යාපාරික අවස්ථා උදා කර ගැනීමටත් ඒවා ප්‍රයෝජනයට ගැනීමත් සඳහා සංවිධාන නිර්මාණය කිරීමත් යනාදී කටයුතු වලදී සිදු කරන්නට යෙදෙන සියලු ක්‍රියාවන් ව්‍යවසායකත්ව ක්‍රියාවලියයි.
(ඉහත හිස්තැන් නිවැරදිව කර ඇත්නම් හා ක්‍රියාවලිය නිවැරදිව විස්තර කර ඇත්නම් නම් කිරීමට 01ක් ද විස්තර කිරීමට ල.02)

5.

i. ඇමරිකානු එක්සත් ජනපදයේ ස්මෝල් බිස්නස් ඇඩ්මිනිස්ට්‍රේෂන් ආයතනය (ලකුණු 01 යි)

- ශ්‍රම ශුක්ෂම කර්මාන්ත නිසා රැකියා සැපයීම
- ජාතික නිෂ්පාදනයට දායක වීම
- දේශීය සම්පත් භාවිතා කිරීම
- මහා පරිමාණ ව්‍යාපාර වලට අමුද්‍රව්‍ය වීම
- ආදායම් ව්‍යාප්ති විෂමතා අවම වීම

(කරුණු 06ක් දක්වා ඇත්නම් ලකුණු 03 යි)

ii. අ

රාජ්‍ය	රාජ්‍ය නොවන
කාර්මික සංවර්ධන මණ්ඩලය	සණස
ජාතික සංවර්ධන මණ්ඩලය	සර්වෝදය
කාර්මික තාක්ෂණ ආයතන	ජයිකා

(නිවැරදිව බෙදා ඇත්නම් එක් පැත්තකට ලකුණු 1 බැගින් ලකුණු 02 යි)

ආ

කාර්මික සංවර්ධන මණ්ඩලය	කාර්මික හා තාක්ෂණ ආයතනය
උපදේශන සේවා සැපයීම	තාක්ෂණ දැනුම ලබා දීම
තාක්ෂණ දැනුම ලබා දීම	උපදේශන සේවා සැපයීම
යටිතල පහසුකම් සැපයීම	

(කරුණු 02 බැගින් දක්වා ඇත්නම් ලකුණු ½ බැගින් ලකුණු 02 යි)

iii. අ)

1. රජයේ විවිධ ගිණුම් පවත්වාගෙන යාම
2. රජයට ණය සැපයීම
3. රාජ්‍ය ණය කළමනාකරණය කිරීම
4. රජය වෙනුවෙන් අන්තර්ජාතික සංවිධාන හා රටවල් සමග කටයුතු කිරීම
5. රජයේ ප්‍රධාන ආර්ථික උපදේශකයා වශයෙන් කටයුතු කිරීම
6. රජයේ බැංකුකරු ලෙස කටයුතු කිරීම (කරුණු 04 ට ලකුණු 02)

ආ)

1. සාමාන්‍ය රේඛනය
2. විශේෂ රේඛනය

(උදාහරණ සහිතව නම්කර පැහැදිලි කිරීමට ලකුණු 02,නම් කර පැහැදිලි කිරීමට ලකුණු 01,නම් කිරීමට ½)

iv.

1. සදුනිගේ නමින් ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කර චෙක්පත එයට බැර කිරීමෙන් පසුව මුදල් ලබා ගැනීම
2. චෙක්පත නිකුත් කරන ලද ආයතනය වෙත චෙක්පත ඉදිරිපත් කර රේඛනය අවලංගු කරවා ගැනීම.

v. (අ)

1. අණකරුට වගන්තියක් සහිතව හෝ රහිතව සාමාන්‍ය හෝ විශේෂ රේඛනයක් කළ හැකිය.
2. ධාරකයාට පහත සඳහන් කටයුතු කල හැකිය.
    - සාමාන්‍ය හෝ විශේෂ රේඛනයක් කිරීම
    - සාමාන්‍ය රේඛනයට බැංකුවක නමක් එකතු කිරීමෙන් විශේෂ රේඛනයක් සිදු කිරීම
    - සාමනා හෝ විශේෂ රේඛනයකට ගණුදෙනු කළ නොහැකිය යන වගන්තිය යෙදීම
3. අය ලබා ගන්නා බැංකුවට හෝ අනලදුට රේඛනය කළ හැකි වීම
4. රේඛනයේ නම සඳහන් වන බැංකුවට (ලකුණු 02)

(ආ) යම් කිසි ගිණුම් හිමියෙකුට ලැබුණු ඉදිරි දිනයක් යොදන ලද චෙකපතක් බැංකු ගිණුමේ තැන්පත්කොට උපලබ්ධිවන තුරු නොසිට බැංකු කළමනාකරුගේ අනුමැතිය ඇතිව එම අවස්ථාවේදිම මුදල් කර ගැනීමක් සිදු කරයි නම් එය බැංකුවක් විසින් චෙක්පත් මිලදී ගැනිම ලෙස හඳුන්වයි. බොහෝ වට රජයේ ආයතන වල හෝ පිළිගත් පෞද්ගලික ආයතනවල චෙක්පත් මෙලෙස මිලදී ගනු ලබයි. (ලකුණු 02 යි)

6.

i. (අ) බැංකු අයිරා යනු ජංගම ගිණුමේ බැර ශේෂය ඉක්මවා යම්කිසි නිශ්චිත මුදල් ප්‍රමාණයක් දක්වා චෙක්පත් නිකුත් කිරීමට නැතිනම් හර කිරීමට ලබා දී ඇති අයිතිය වේ. (ලකුණු 02)

(ආ) තාවකාලික බැංකු අයිරාවක් යනු දින 30 සිට දින 90 දක්වා කාල සීමාව සඳහා ලබා දෙන එම කාල සීමාව තුළ පියවා දැමිය යුතු අයිරා විශේෂයකි. කෙටි දැනුම් දීමකින් හා ඇප තැබීමකින් තොරව ලබා ගැනීමට හැකි වේ.ස්ථාවර බැංකු අයිරාවක් යනු සාමාන්‍ය වර්ෂයක් වැනි කාලයකින් පිය විය හැකි සාපේක්ෂව පොලිය අඩු ඇප තැබීමක් හා ගිණුම් හිමියාගේ ලිඛිත ඉල්ලීමක් මත නිකුත් කරනු ලබන අයිරා විශේෂයකි. (ලකුණු 02)

ii. (අ) ඉතිරි කිරීම දිරිමත් කිරීමත් සාමාජිකයින්ට ණය සැපයීමත්අරමුණු කර ගෙන සාමාජිකයින්ගේ ඉතුරුම් ලෙස හා සාමාජික කොටස් ලෙස මුදල් ලබා ගෙන සාමාජිකයින්ට පමණක් ණය සපයන සමුපකාර පනත යටතේ සමුපකාර කොමසාරිස් වෙත ලියා පදිංචි කළ යුතු ආයතන විශේෂයකි. (ලකුණු 01)

- සාමාජිකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම් සඳහා අලෙවි මධ්‍යස්ථාන පවත්වගෙන යාම.
- තැන්පතු භාර ගැනීම හා සාමාජිකයින්ට ණය සැපයීම (ලකුණු 01)

(ආ)

- **ණය කාඩ්පත්**
- කිසියම් නිශ්චිත වට්නාකමක් දක්වා අනුමත වෙළඳ ආයතන වලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකුවක් හෝ බලයලත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කාඩ්පත් විශේෂයකි. (ලකුණු ½)
- **හර කාඩ්පත්**

  වාණිජ බැංකු ගිණුම් හිමියෙකුට තම ගිණුමේ ඇති මුදල් ගණුදෙනු සඳහා පැවරීමටත් ටෙලර් යන්ත්‍ර මාර්ගයෙන් මුල් ආපසු ලබා ගැනීම සඳහාත් උපයෝගී කර ගන්නා කාඩ්පත් විශේෂයකි. (ලකුණු ½)

ණය කාඩ්පත්	හර කාඩ්පත්
1.බැංකුවේ මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය නොවේ	1.බැංකුවේ මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය වේ.
2.භාණ්ඩ හා සේවා ණයට ලබා ගත හැකිය	2.තමාගේ ගිණුමේ ඇති මුදල් ප්‍රමාණයට භාණ්ඩ හා සේවා ලබා ගත හැකිය

(ලකුණු 01)

iii. (අ) අනාගතයේ දී අවදානම් දැරීමට සිදුවේ යැයි සිතන සියලුම රක්ෂිතයින්ගේ වාරික මුදල් වල එකතුවෙන් රක්ෂන අරමුදල ගොඩ නැගී ඇත.එහෙත් එම සියලුම රක්ෂිතයන් හට අවදානම් සිදු නොවන අතර අවදානම් වලට ලක්වන අයට රක්ෂණයෙන් වන්දි ලැබේ.එම නිසා රක්ෂනයේ පදනම අවදානම් ඒකරාශීකරණය යන මූල ධර්මය මත පදනම් වේ. (ලකුණු 02)

(ආ)

1. අවදානම පුරෝකථනය කළ හැකි වීම
2. අවදානම අහඹු ලෙස සිදු වීම
3. සම්බන්ධතාවයකින් තොර වීම
4. සත්‍යාපනය කළ හැකි වීම (ලකුණු 02)

iv. (අ)

1. රක්ෂ්‍ය හිමිකම
2. උපරිම විශ්වාසය
3. හානි පූර්ණය - දායකත්වය ,ආදේශනය
4. ආසන්නතම හේතුව

උපරිම විශ්වාසය යනු රක්ෂකයා හා රක්ෂිතයායන දෙපාර්ශවයම රක්ෂන එප්පුව සම්බන්ධයෙන් වැදගත් වේ යැයි සලකනු ලබන සියලුම කරුණු සම්පූර්ණ සත්‍ය තොරතුරු නොසඟවා හෙළිදරව් කල යුතු බවයි. (ලකුණු 02)

(ආ)

1.අනාවරණය නොකිරීම/හෙළිදරව් නොකිරීම
2.හිතා මතා වැදගත් කරුණු වසන් කිරීම
3.වංචනික දුර්නිරූපනය
4.අහිංසක දුර්නිරූපනය (ලකුණු 02)

v. (අ) පණිවිඩය යවන්නා
1. පණිවිඩය නිවැරදිව සකස් කිරීම
2. ලබන්නාට තේරුම් ගත හැකි වන ආකාරයට ඉදිරිපත් කිරීම
3. යෝග්‍ය ඵලදායි මාධ්‍යක් තෝරා ගැනීම
4. ප්‍රතිපෝෂණයක් ලබා ගැනීම (කරුණු 02 ට ලකුණු 01යි)

පණිවිඩය ලබන්නා
1.නිවැරදි වේලාවට ලබා ගැනීම
2.අපැහැදිලි දේ ඇතොත් පැහැදිලි කර ගැනීම
3.කලට වේලාවට අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම
4.අදාළ අවස්ථාවේ දි පණිවිඩය කියවා හෝ ඇහුම්කන් දී අවබෝධ කර ගැනීම (කරුණු 02 ට ලකුණු 01 යි)

(ආ)

1.බාහිර පාර්ශවයන්ට ප්‍රයෝජනවත් තොරතුරු කලට වේලාවට සැපයිය හැකි වීම
2.ගනුදෙනු කරුවන්ට අවශ්‍ය තොරතුරු සැපයිය හැකි වීම
3.ගනුදෙනු ප්‍රමාණය වැඩි කර ගත හැකි වීම
4.මහජන සම්බන්දතා ගොඩනගා ගැනිම හා වර්ධනය කර ගත හැකි වීම
5.ව්‍යාපාරයට අවශ්‍ය භාණ්ඩ පිළිබද තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි වීම. (ලකුණු 02)

7.

i. (අ) ප්‍රතිචාරය -පණිවිඩය ලැබුණු පසු ලබන්නා දක්වන ප්‍රති ක්‍රියාවයි.
ප්‍රතිපෝෂණය -පණිවිඩය ලැබුණු බව හා තේරුම් ගත්තා ද යන්න යවන්නා තහවුරුවක් කර ගැනීම හා ලබන්නාගේ පිළිතුර

ලකුණු ½)

(ආ)
1.සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගැනීම සදහා
2.අලෙවි ප්‍රර්ධන කටයුතු සදහා
3.මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කිරීම සදහා
4.වෙළද ගනුදෙනු වලදී අදාළ පාර්ශ්ව සමග අදහස් හුවමාරු කර ගැනීම සදහා
(නිදසුන් දක්වා පැහැදිලි කිරීම 2 ට ලකුණු 02)

ii. (අ)
1. පණිවිඩය හුවමාරුවන භූමි ප්‍රදේශය
2. යොදා ගන්නා මාධ්‍ය
3. සම්බන්ධ වන පාර්ශ්ව
4. පණිවිඩය ගලා යන දිශාව
5. සංවිධාන ව්‍යුහය
6. භාවිතා කරන තාක්ෂණය
(කරුණකට ලකුණු ½ බැගින් කරුණු 4 ට ලකුණු 2 යි)

(ආ)

1. සන්නිවේදන පද්ධති නිර්මාණයේ දී ඇති අඩුපාඩු
2. පුද්ගලයින්ගේ භාෂාව පිළිබද දැනුම අඩු වීම
3. ආකල්පමය බාධා හා උචිත මාධය තෝරා නොගැනීම
4. පණිවිඩය දුර්වල ලෙස විස්තර කිරීම
5. වෙනත් පිළි ගත හැකි (ලකුණු 02 යි)

iii.
(අ) ප්‍රවාහන හා සැපයුම් සේවා යනු පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම තහවුරු කිරීමේ අරමුණින් භාණ්ඩ සේවා හා අදාළ තොරතුරු ඉදිරියට හා පසුපසට ගලා යාම,ඒවායේ ආරම්භක අවස්ථාවේ සිට පරිභෝජන අවස්ථාව දක්වා කාර්යක්ෂම හා සඵලදායිව සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියයි.

(ආ)
1. සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති
2. නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති
3. නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා අතට පත් කිරීම සංකීර්ණ වූ පද්ධති
4. නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහය සහිත පද්ධති

iv. (අ)

1. මෝටර් රථය ලියාපදිංචි කිරීම
2. වාර්ෂික ආදායම් බලපත්‍රය ලබා ගැනීම
3. රක්ෂණ සහතිකයක් ලබා ගැනීම
4. රියදුරු බල පත්‍රය ලබා ගැනීම
5. මහා මාර්ග නීති පිළි පැදීම
6. දුම් සහතික ලබා ගැනීම (කරුණු 04 ට ලකුණු 02 යි)

(ආ)

1. විදේශ ගමන් බල පත්‍රය
2. වීසා බල පත්‍රය
3. ගුවන් ප්‍රවේශ පත්‍රය (කරුණු 03 ට ලකුණු 02 යි)

v. (අ)

1. ගමනාන්තය දක්වා නියමිත ගාස්තුව පමණක් ගෙවීම හා ඒ සඳහා ටිකට් පත්‍රක් ලබා ගැනීම
2. ගමනාන්තය දක්වා ආරක්ෂිතව ගමන් කිරීම
3. බස් රථ වල දුම් බීමට එරෙහි වීම
4. අධික වේගයෙන්,නොසැළකිල්ලෙන්,මාර්ග නීති උල්ලංඝණය කරමින් ධාවනයේ යෙදෙන්නේ නම් එයට විරුද්ධ වීම
5. ඝෝෂා කාරී ලෙස රේඩියෝ කැසට් රෙකෝඩර් ක්‍රියාත්මක වන්නේ නම් ඊට විරුද්ධ වීම
6. රියදුරුගේ හා කොන්දොස්තර වරයාගේ විනීත හා ආචාරශීලී ඇමතුම් පැවතුම් ලැබීම

(කරුණු 04ට ලකුණු 02)

(ආ) මුලින්ම මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොට ඉන්පසුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ වාර්ෂිකව ලියාපදිංචි කළ යුතුය (ලකුණු 02 යි)

8.

i. (අ) අතරමැදියන් යොදා ගැනීමේ වාසි

- විවිධ නිෂ්පාදකයින් නිපදවන භාණ්ඩ හා සේවා ලබා ගෙන අවශ්‍ය වේලාවට පහසු ස්ථානයකදී ලබා දීමට කටයුතු කිරීම
- නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම පහසු වීම
- වෙළඳපොල තොරතුරු අදාළ පාර්ශවයන්ට පහසුවෙන් ලබා ගත හැකි වීම
- හුවමාරු ක්‍රියාවලිය සරළ වීම (වාසි 02ට ලකුණු 01 යි)

<u>අවාසි</u>

- වෙළඳපොළේ අත්‍යවශ්‍ය භාණ්ඩ හිගයක් ඇති විය හැකි වීම
- භාණ්ඩ වල මිල ගණන් ඉහළ යා හැකි වීම

(අවාසි 02ට ලකුණු 01 යි)

(ආ) <u>නිෂ්පාදකයාට</u>

- නිෂ්පාදකයාගේ නිෂ්පාදිත තොග වශයෙන් ලබා ගැනීම
- වෙළඳපොළ පිළිබඳ තොරතුරු ලබා දීම
- නිෂ්පාදකයාට විවිධ සේවාවන් සැපයීම (කරුණු 02 ලකුණු 01යි)

<u>සිල්ලර වෙළෙන්දාට</u>

- භාණ්ඩ තොග වශයෙන් සැපයීම
- සිල්ලර වෙළඳසැලටම භාණ්ඩ ගෙනවිත් බාර දීම
- ණය පහසුකම් සැපයීම
- භාණ්ඩ තේරීම,ඇසිරීම.මිශ්‍රකිරීම,ආදි සේවාවන් හි නිරත වීම (කරුණු 02 ට ලකුණු 01 යි)

ii. (අ)

1. ස්වභාවික සම්පත් බෙදී යාමේ විෂමතාව
2. සාපේක්ෂ පිරිවැය වාසිය
3. සමහර නිෂ්පාදිත සම්බන්ධව සමහර රටවල නීතිමය ඒකාධිකාරයක් තිබීම
4. භාණ්ඩ ප්‍රවර්ධනය
5. වෙළඳ බාධක අවම වීම (ලකුණු 02 යි)

(ආ)

- ණයවර ලිපි මගින්
- බැංකු අණකර මගින්
- විද්‍යුත් ගෙවීම් ක්‍රම මගින්
  - ❖ අන්තර්ජාල පෙර ගෙවුම් කාඩ්පත්
  - ❖ අන්තර්ජාල පෙර ගෙවුම් පහසුකම්
  - ❖ විද්‍යුත් ගෙවීම් සේවා ආයතන හරහා (ලකුණු 02)

iii. (අ) කිසියම් රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට ගෙනවිත් වෙනසකට භාජනය කර හෝ නොකර නැවත වෙනත් රටකට හෝ රටවලට යැවීම ප්‍රති අපනයන වෙළඳාමයි.

විදේශ රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට නොගෙන වරාය තුළ නැවත සකසා හෝ සැකසීමකින් තොරව වෙනත් රටකට හෝ රට වලට අපනයනය කිරීම අන්තරල වෙළඳාමයි.

(වෙනස දැක් වීමට ල.01 අදාළ නදසුන් 2ට ල ½ බැගින් ල.01,සුදුසු නිදසුන් 2 ට ලකුණු ලබා දෙන්න)

(ආ)

1. අතිරික්ත නිෂ්පාදිත අපනයනය කළ හැකි වීම
2. රටේ නිපද විය නොහැකි නිෂ්පාදිත ආනයනය කළ හැකි වීම
3. විදේශ විනිමය උපයා ගත හැකි වීම
4. ආර්ථික පිරි මැසුම් අත් කර ගත හැකි වීම
5. ජාත්‍යන්තර වෙළද සබදතා හා ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය වීම
6. නව තාක්ෂණික හා කළමනාකරණ නිපුණතා වර්ධනය වීම
7. ආර්ථික සංවර්ධනයට පිටුවහලක් වීම (කරුණු 04 ට ල.02)

iv.

1. අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීම
2. විදේශ ගැනුම්කරුවා සොයා ගැනීම
3. අවශ්‍ය වන්නේ නම් අපනයන බල පත්‍ර ලබා ගැනීම
4. ආනයනකරුගෙන් ලැබුණු මිල විමසුමකට ප්‍රතිචාරයක් වශයෙන් මිල කියුමක් යැවීම
5. ආනයනකරුගෙන් ඉන්ඩෙන්ටුව ලබා ගැනීම
6. භාණ්ඩ තොගය නැව්ගත කිරීම සදහා අවශ්‍ය ඉඩකඩ වෙන් කර ගැනීම හා අවශ්‍ය ලියවිලි සකස් කර ගැනීම
7. නැව්ගත කිරීමට සුදුසු වන ආකාරයට භාණ්ඩ ඇසුරුම් කිරීම
8. අපනයන භාණ්ඩ තොගය රක්ෂණය කිරීම
9. භාණ්ඩ නැව් ගත ගර නෞභාරපත ලබා ගැනීම
10. මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම (අනුපිළිවෙලින් දැක්වීමට ල.04 යි)

v. (අ)

1. ආනයනය සීමා කිරීම
2. අපනයනය සීමා කිරීම
3. ආනයන/අපනයන තහනම් කිරීම
4. වෙළඳ ගිවිසුම්
5. දැඩි විනිමය ප්‍රතිපත්ති (කරුණු 4 ට ල.2 යි)

(ආ) රටවල් කිහිපයක් විසින් බහු,තීරු ගාස්තු සහ වෙළඳාම පිළිබදව ගිවිසුමකට එළඹි නිදහස් වෙළද ප්‍රදේශයක් (ලකුණු 01)

<u>නිදසුන්</u>

- යුරෝපීය සංගමය,
- ආසියාන් සංගමය
- රටවල් අටේ කණ්ඩායම (නිදසුන් 2 ට ලකුණු 01)